## එතෙර උපන් නොදුටු මිණිපිරියට ආච්චි ගෙන්

□යියා කියා නළවන්නට බැරි බව්නා
හයියා තිබෙන මුත් හිත හරියට රිදෙනා
ගව්වා දුර ඉන්න ඔබ හිත මවාගෙනා
□යියා කියා නළවන්නම් කවි වලිනා

එතෙරේ ඉන්න මගෙ ආදර මිණිපිරිය
නිතරේ මතක් වෙන මුත් දකිනට නැතිය
මහදේ තිබෙන අදරේ නොවෙනස් වෙතිය
සුරිඳේ ඉතින් රැකගනු මගෙ මිණිපිරිය

නමක් වඩන මගෙ ආදර පොඩි දුවට
මතක් වෙන්න කව□ හරි මම ඔබට
උපන් දිනේ සමරන □ සිහිවෙන්ට
ගසක් රෝපණය කෙරුවා මම ඔබට

ආසා තිබෙන මුත් නුඹ දකිනට මහදී
දැස දුබල වේවිද ඔබ එන විටදී
පසා කරන් හදවතෙ යන අදර පොදී
මෙසා දුකක් විඳිනට වුණෙ ඇයි අගදී

සිහිනෙන් ඇවිත් දුවණිය ඔබ මගෙ තුරුලේ
ඉන්නවා නේද සිප ගන්නට කර ආලේ
රැයකින් එලිවෙනා සිහිනෙන් නැතිය පලේ
එලයක් වෙන්න ගුවනින් එනු ගෙදර ලොලේ

ඉතින් දුවේ ඔබෙ දුක සැප දැන් කෙසෙද
ගිරා සැළලිහිණි ඔය රටෙ ඉන්නවද
පුරා මගෙ ඇසට උන් දිව්වොත් හරිද
අසා බලන්නම් මගෙ දුව දැන් ලොකුද

පුංචි දුවේ දැන් ඔබහට ලිව්වා ඇතී
සිතින් ගතින් ආසිරි පැතුවා බලැතී
වෙතත් ලොවේ සැම දෙවියෝ පිහිට වෙතී
සුවෙන් සැතපෙන්න බුදු සරණයි බලැතී

**ජස්ලින් කාලිංග**
ශ්‍රී ලංකාවේ සිට

**පහන් වැට ට ලියන ඔබ ට**

සන්නසේ පහන් වැට විශේෂාංගය සඳහා අප වෙත ලැබී ඇති නිර්මාණ සංඛ්‍යාව අති මහත් ය. ප්‍රශස්ථ මට්ටමේ නිර්මාණ අප මහත් සේ අගය කරන නමුදු අපට ලැබෙන කිසිම නිර්මාණයක් අවතක්සේරු කර කුණු කූඩයට දැම්ම අප අතින් කිසි විටෙක සිදුනොවන දෙයකි.
ඔබේ නිර්මාණය ඉඩ ලැබෙන පරිදි ඉදිරි කළාපයක පළවනු ඇත.

## නූතන පතිනි වැලපීම

පතිකුලයට පැමිණි දිනේ
ඉඳලම මම පෙරුම් පුරලා
හදගත්ත ගේ පොඩියත්
ආසාවේ බැරුවා

බිමට 'රියල් ටිම්බ(ර්)' දමලා
'පැල්මට් ක(ර්)ටන්' එල්ලලා
ගැලපෙන පුටු සැටි තිබ්බම
පෙනුම අලංකාරයි

අළුත්ම කැබිනට් එක උඩ
'ප්ලාස්ම' ටී වී එක තිබ්බම
ගෙට එන අය හොල්මන් වෙන
ගාම්භීර පෙනුමයි

හැම එකේම ණය ගෙව්වම
සතියෙ පඩිය හිඳිලා යනවා
කන-බොන දේ බේත්-හේත්
තව දරුමල්ලන්ගේ වියදම්
ඊට පස්සෙ දිවිය අපේ
ප්‍රශ්ණ වැලක වෙලුනයි

මම ඔයාගෙ ප්‍රිය භාරිනෙ
ජීවිතේම සහකාරිනෙ
ජීවන බර උසුලන්නට
දෙන්නම් සහයෝගේ

බොහෝ වෙහෙසි ලැබගත් පසු
සහයෝගෙට රැකියාවක්
අපි දෙන්නගෙ ජීවිතයට
රිදී ඉරක් වැටුණයි
ඊට පස්සෙ ජීවන ගඟ
සෙමින් හොඳින් ගැලුවයි

වැඩපල තුළ කලබලයකි
තැන තැන ලොකු කසුකුසුවකි
'චීනය' ගැන නිතර නිතර
කියවෙනු මට ඇසුණා
ලාබ රටෙන් බඩු ගෙනෙන්න
ලොකු ලොක්කන් සැරසෙන බව
වටහාගත්ත මගෙ හදවත
ශෝක ගඟක ගිලුණා

මගේ හිතට දැනෙන දුකට
මේ විලසට ලියවෙන කවි
කොයි ලෙසකින් හෝ මට නම්
නවතගන්න බැරුවා

**සුභාෂිණී හේරත්**
ඇට්වුඩ්

සාහිත්‍යයට පෙම් බඳින නිර්මාණකරුවනි නිර්මාණකාරියනි www.ketapathpawra.com වෙබ් අඩවියට ගොඩවෙන්න අමතක නොකරන්න

# ජීවිතේට පාඩමක්!

දවසක් උදවෙලා ඒ දවස නිමාවෙද්දි ගතවුණු දවසෙ සිදුවුණු හුඟක් සිදුවීම් අත්දැකීම් විදියට හරි; පාඩමක් විදියට හරි අපේ ජීවිත වලට එකතු වෙනවා. හුඟක්ම වෙලාවල් වලට අපි නොහිතන දේවල් එහෙමත් නැතිනම් අපි ගණන් ගතයුතු නෑ කියලා සුළුවෙන්හිතන දේවල් අපේ ජීවිත වලට ලෙකු පාඩම් කියලා දෙනවා. මං මේ කියන්න යන සිදුවීමත් බොහොම පුංචි දෙයක් විදියට ඔබට පෙනේවි. ඒත් එහි ඇතුළාන්තයේ, ජීවිතයට එකතු කර ගත හැකි දෙයක් තියෙනවා කියලා මට හිතෙනවා.

අපි සාප්පුවකට ගිහින් ඩොලර් පහක වටිනාකමක් ඇති භාණ්ඩයක් මිලදී ගන්න ඩොලර් සියක නෝට්ටුවක් දුන්නට මාරුකාසි පිළිබඳ ප්‍රශ්ණයක් ඇති වෙන්නේ නෑ. නමුත් බස් රථයකදි ඒ තත්ත්වය වෙනස්.

මේ දිනවල මම ඉන්නේ මගේ මල්ලිගෙ නිවසෙ රිච(ර්)හිල්ස් වල. උදෑසන කාර්‍යාලයට යන දුරින් අඩක් බස් රථයෙනුත් ඉතිරිය කාර්‍යාලයේ වාහනයෙනුත් ගමන් කරන මං, බසයට නගින්නේ බස්රථය ගමනාරම්භ කරන නැවතුමෙන්මයි.

පසුගිය දවසක මට කලින් බසයට නැගුණු කළු ජාතික කාන්තාවක් ඇගේ ගමනාන්තය දක්වා වූ ප්‍රවේශ පත්‍රයේ වටිනාකම වන ඩොලර් පහක මුදලට ඩොලර් විස්සක නෝට්ටුවක් දීම නිසා රියැදුරු මහතා සමග බහින් බස් වුණා. මේ රටේ කෙනෙකු වූ රියැදුරු , ඇය ප්‍රවේශ පත්‍රය ඉල්ලන විටත් ඇය ගැන තැකීමක් නොකළ නිසා ඇයගේ කේන්තිය ඉහවහා ගියා. රියැදුරුද එම නෝට්ටුව මාරු කළ නොහැකි බවම කියමින් ප්‍රවේශ පත්‍රය දීමත් ප්‍රතික්ෂේප කළා. ඒ විතරක් නෙවේ; නියමිත මුදල රැගෙන බසයට නගින ලෙස සඳහන් කර ඉදිරිපස දෙරටුවේ අලවා ඇති දැන්වීමද පෙන්නුවා. ඇගේ ප්‍රවේශ පත්‍රයටද මා මුදල් ගෙවූවද, එය ඇගේ වරදක් හෝ අතපසුවීමක් බව පිළිගන්නට ඒ කළු ජාතික කාන්තාව කැමති වූයේ නැති නිසා ඔවුන් එකිනෙකාට බැණ වැදුණා.

මා ඒ කාන්තාවට කලින් බසයෙන් බසින විට ඈ මට පැහැදිලි ඉංග්‍රීසි බසින් කීවේ 'මේ මිනිහා මගෙ දවස කෑවා' කියලයි. නමුත්; සැලකිය යුතු, එහෙත් ඇය සුළුවෙන් තැකූ පුංචි දෙයක් නිසා 'ඇගේ දවස කාගත්තෙ ඇයමයි' කියලයි මට හිතුණෙ.

**මේනකා ජයතිලක**
ක්වීන්ස්ලන්තය




සඳුනි, අන්න කංචුක ආවා.
ඇති යාන්තම්, කවදාවත් වෙලාවට එන මනුස්සයෙක් නෙවිනේ.
ඇති, ඇති..... දෙන්නගේ කයිවාරුව. නගිනවා ඉක්මනට.
දැන්ද තදියම, පරක්කු වෙලා ආවෙ ඔයා නේ. අපි මොනතරම් වෙලාවක් ඇඳගෙන බලාගෙන හිටියද?
අනේ ! සොරි මැඩම් !
ඒක නෙමේ කංචුක, කෝ අපේ අනිත් නඩේ?
බයවෙන්න එපා. ඒ ගොල්ලෝ නියම තැනට, නියම වෙලාවට ඇවිල්ල ඇති.
සඳුනි ! කවදාවත් ලංකාවෙ මිනිස්සු වෙලාවට වැඩ

*හරි දියුණුයි නේ ලංකාව. ඔයා කොහොමද ඔය වාහනය හිත පාලනය කරගෙන එළවන්නේ.*

*සුළු දෙයක්. අපිට මේවා හොඳට පුරුදුයි ළමයෝ.*

නැහැ.
අනේ ! මේ දහර, ඔයත් ලංකාවෙ හිටිය නම් ඔය පුරුද්ද අත් ඇරගන්න බැරි වෙනවා.
ඒක නෙමේ, කංචුක අද ඔයා අපිව කොහේද ගෙනියන්නේ?
ඔයාට ඕන කිව්වේ, ටිකක් විනෝද වෙලා, ලංකාවේ සුපිරි තත්ත්වය බලා ගන්න නේ. මම ගෙනියන්නම් හැම දෙයක්ම හොඳට බලාගන්න පුළුවන් තැනකට. අපිට නිදහසේ කථා කරන්න පුළුවන් තැනකට.

කංචුක ගේ වාහනය ගෝල්ෆේස් පිටිය කරා ඇදෙද්දී දෑස් දක්වා මා බලා සිටියේ විදුලි පහන් දැල්වෙමින් දිස්වෙන ගොඩනැගිලි, කඩිගුලක් මෙන් දිවෙන වාහන, දියරැළි නංවමින් කිසිඳු වෙනසක් නොපෙන්වා අභීත ලීලාවෙන් දිවෙන රළ දෙසය. දැවැන්ත වාහනයේ සී.ඩී. පටය තුළින් නැග එන මෝහනීය සංගීත රාවයට දැහැන් බිඳිමින් වාහනයේ රූපවාහිනී යන්ත්‍රයේ අඩ නිරුවත් ලියන් රඟදෙන අයුරු මා බලා සිටියේ දෑස් දල්වා ගෙනය.

එය බටහිර සංගීතයක්. දර්ශනය බටහිර වූවා නම්, මම දොස් නො පවරමි. එහෙත්.... මෙවැනි දසුන් දැකීම ලක්බිම ගමන් ගන්නා මඟ, රුචිකත්වය කුමක්දැයි තේරුම් ගැනීම අපහසු නොවීය.

කංචුක, හරි දියුණුයි නේ ලංකාව. ඔයා කොහොමද ඔය වාහනය හිත පාලනය කරගෙන එළවන්නේ.
දහරා, සුළු දෙයක්. අපිට මේවා හොඳට පුරුදුයි ළමයෝ.

අඩ අඳුරේ තිබූ විශාල සමාජ ශාලාවක් අසල රථය නැවතුනෙන් මාද, සඳුනිද රථයෙන් බැස ගත්තේ මද විමතියෙන් හා චකිතයෙනි.
"හලෝ, දහරා දැක්ක කල්. අපි ඕගොල්ලෝ එනකල් බලාගෙන හිටියේ. "ඉතින්... කොහොමද සැප දුක්!"
"දුකත් නෑ. සැපත් නැහැ. මධ්‍යස්ථයි. චම්පික, දේවි, අකලංක, නිලූ අවුරුද්දකට පසු දැකීම ප්‍රියජනකය. ඔවුන් මගේ හිතවත් මිතුරු කැලය. එමු ඇතුළට....

ඇතුල් වූ විගස අඩ අඳුරේ දැල්වෙන විදුලි බුබුළු, මැද පේළියට තනා ඇති සුව පහසු ආසන මත අප දිග ඇදුනේ නිතැතිනි. පිරී ඉතිරී ඇති සමාජ ශාලාවේ සුන්දර බාල ලියන්, තාරුණ්‍යය නොඉක්මවූ තරුණයන් අනේක විධි විලාසිතාවන්ගෙන් සැරසී රඟදෙන්නේ අති ප්‍රවීණ රංගධාරීන් ලෙසය. ඩී.ජේ. පටය තුළින් නැග එන බටහිර සංගීත රාවය මා අසා ඇති සංගීත රාවයන්ට වඩා අතිශය උසස් මට්ටමක රැඳී ඇති බව අතිශයෝක්තියක් නොවේ. දිස්වෙන විදුලි බුබුළු, ලියන්ගේ සිනා හඬ, මවා පාන්නේ සුන්දර චමත්කාර දසුනකි. අඳුරු කුටි තුළට සෙමෙන් රිංගා ගන්නා තරුණ ජෝඩු කුටි තුළින් රැය පහන් වනතුරු එළියට නොම එන බැව් මා දැන ගත්තේද දේවි ගෙනි.
දහරා, මොනවද බොන්නේ?
මට ලයිම් ජූස් එකක්. ඕගොල්ලෝ කැමති දෙයක් බොන්න. එහෙනම් චම්පික අනිත් අයට බියර් ඕඩර් කරන්න. බයිට් එක්කම.

දහරා ඔයා අද ඩාන්ස් කරන්නේ නැද්ද?
මි....මට අද මහන්සියි. ඕගොල්ලෝ ඩාන්ස් කරන්න. මං බලාගෙන ඉන්නම්. සැවොම රඟහල වෙත ගිය පසු මා තනියට සිටියේ අකලංක පමණි.
ඉතින්, අකලංක, කොහොමද ජීවිතේ? සුන්දරද , අසුන්දරද?
"ඔයි දෙකම මවා ගන්නේ අපි හලෝ"
ඒ කතාවෙත් ඇත්තක් තියෙනවා.
පොඩ්ඩක් ඉන්න,
පාරමී .... මම දැන් ඉන්නේ, චම්පිකලගේ ගෙදර. දන්නෙ නැද්ද අද අපි ටිකක් සෙට් උණා. ඔයා නිදා ගන්න. මම එනකොට ටිකක් රෑ වේවි.
රිසීවරයේත්, ජංගම දුරකථනයේත් හඬ ක්‍රියා විරහිත කරවූ ඔහු මදෙස බැලුවේ වීර ක්‍රියාවක් කළ එකකු සේය.
අනේ, අනේ, කතා කළේ භාර්යා තොමෝ නේද?
මොකටද බොරු කිව්වේ? දැන් චම්පිකට කෝල් කරල ඇහුවොත්.
බයවෙන්න එපා. ඌත් මෙතනම නේ. එහෙම පාවල දෙන්නේ නැහැ.
මම ප්‍රශ්නයක් අහන්නද? අවංකව උත්තර දෙන්න.
ඇයි පිරිමි ගෑණුන්ට ඔය තරම් බොරු කියන්නේ?
මේක නේ දහරා, අපි කරන කියන හැම දෙයක්ම ගෑණුන්ට කියන්න ගියොත් වෙන්නේ මහ අවුලක්.
මෙහෙම එළියට බහින්න පුළුවන්ද?

ඔයා හිතන්නේ සේරම ගෑණු මෝඩයෝ කියලද?
ඕවා විශ්වාස කරන්න.
අපෝ නැහැ. ඒත් ගෑණුන්ට නැගිටින්න, එරෙහි වෙලා ඉඳලා බැහැ.
ඇයි?
අපි අත්‍යවශ්‍ය භාණ්ඩ වෙලා තේරුණාද?
අනේ? මගෙ කට....
දහරා, ඔයාවත් තාම හරියට පුරුෂ පරාණ ගැන දන්නේ නැහැ. "හොඳයි, ඔයා මට කියන්න බලන්න ජීවිතේටම හොරා නොකාපු එකෙක් ඉන්නවද කියලා.." හැම එකාම හොරා කනවා. හැබැයි, තමන්ගෙ ගෑණිට නොදැනෙන්න. පිරිමි ජාතියේ හැටි එහෙමයි.
පිරිමි ගෑණු වගේ හිත හිත, ලතවේවි ඉන්නෙ නැහැ. බෝ පැල කියල පූජා කරන්න තරම් පාරිශුද්ධත්වයක් අපි ළඟ නැහැ.

හොඳයි... මේ ප්‍රශ්නෙට උත්තරේ මොකක්ද? ගෑණියෙක් හොරා කාල අහු උනොත් පිරිමි දරණ ප්‍රතිචාරය මොකක්ද?
මෙහෙම නේ. ගෑණුන්ටත් හැඟීම්, ආශාවල් තියනවා. අද කාලේ සත්පත්තිනි අම්මලා හොයන්න අමාරුයි. හැබැයි, වැඩේ අනාගෙන ගෙදර ආවොත්, කෙළින්ම එළියට දානවා. කිසිම අනුකම්පාවක්, සමාවක් නැහැ.

ඒක අසාධාරණ කතාවක් නේ. ඕගොල්ලන්ට ඕන කරණමක් ගහන්න පුළුවන්. ඇයි ගෑණු ගැනත් ඒ විදියට හිතන්න බැරි?
එතකොට කොහේද ගෑණු කමක්. සදාචාරය, දරුවන්ට දෙන ආදර්ශය. පවුල් සංස්ථාවේ වගකීම්, පාලනය, ඒවට මොකද වෙන්නේ?

එතකොට හැමදේම ඉවසගෙන ගෑණියෙක් විතරයි දස සීලෙම ආරක්‍ෂා කරන්න ඕන.
අන්න ! ඔයාට දැන් තේරුණා.

කංචුක, මම ඔය ආකල්පයට විරුද්ධයි. ඒත් ඔයා කියන දේත් ඇත්තක් තියනවා. වැස්සටත්, වැදු අම්මටත් නිවනක් නෑ කියනවනේ. සමහර ගෑණු විඳවන්නේ දාලා යන්න බැරි දරුවො නිසා. අවමානය, පවුල් සංස්ථාව ගැන හිතන නිසා. එක ඇඳේ නිදා ගත්තත්, සීමා පවුරු බැඳගෙන උණුසුමක් ආදරයක් නැතුව හූල්ලමින් අඬන ගෑණු ඕනතරම් ඉන්නවා.
වෙන්න පුළුවන් දහරා, පිරිමියෙකුට වගේ ගෑණියෙකුට එළියට යන එක ලේසි නැහැ. හුඟක්ම බැමි වලින් බැඳිලයි ඉන්නේ. බටහිර රටවල් වගේ නෙමිනේ ලංකාව.

මට තේරෙනවා. ඒත් ලංකාවෙත් සදාචාරය ඉක්මවලා, බැමි වලින් මිදිලා යථාර්ථයක් නැති ලෝකෙට වේගයෙන් ඇදිල යනව වගේ.
ඒක නවත්වන්න බැහැ. අපේ ඇස් ඉදිරිපිටම අනාගත පරපුරවල්වල විනාශය පටන් අරන්.
කංචුක, පිරිමියෙක් වෙලත් ඔයා කරපු විග්‍රහය දුන්නු අවංක උත්තර හැම ගැහැණියක්ම වටහා ගනිවි. හොඳින් තේරුම් ගනිවි. පිරිමි හිත් ගැන ඔයා මට නියම අවබෝධයක් දුන්න නිසා මම ඔයාව දකින්නේ අවංක දාර්ශනිකයෙක් විදියට.
තැන්ක්ස්.... හොඳේ....
දහරා.... දැන් ප්‍රශ්නවලට උත්තර හොයා ගන්න ඇති නේ? යමු ඩාන්ස් කරන්න....
නිලුගේ වදයෙන් බේරීමට බැරි තැන අඩ අඳුරේ රඟහල වෙත පිය නැගුයේ සිතේ ඇති වූ ව්‍යාකූලත්වය කලකිරීම මඳකට හෝ තුණී කර ගැනීමටය.

**කාන්ති වික්‍රමසූරිය.**